**මොණරාගල දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 18 - 2023**

**--------------------------------------------------------------------------**

## 1. විගණන මතය

**1.1** මොණරාගල ගොවිජන සේවා කාරක සභා 18ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන කාරක සභා 18 කට අදාළ 2023 වර්ෂයේ නිකුත් කර තිබුණ විගණන වාර්තා 18 හි කාරක සභා 17 ක මතය තත්ත්වාගණනය කර එක් කාරක සභාවක් සඳහා අහිතකර මතයක් ප්‍රකාශ කිරීමට හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන සේවා කාරක සභා 18 ක රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුල අඩංගු විය යුතු සංරචකයක් වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට සියලු මධ්‍යස්ථානවලට උපදෙස් දී ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන කට්ටලය සියළු සංරචකවලින් සමන්විතව ඉදිරිපත් කළයුතුය. |
| (ආ) ගොවිජන සේවා කාරක සභා 16 ක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017 පෙබරවාරි 09 දිනැති අංක 15/2016 දරන චක්‍රලේඛය 107 (සංශෝධන 05) අනුව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වාර්ෂික ගිණුම් ඉදිරිපත් කල යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ ප්‍රමිත සටහන අනුව එම අනුකූලතාවය පවත්වා නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අනුව වාර්තාව සකසන ලෙස උපදෙස් දී ඇති අතර, ඉදිරියේදී නිවැරදි කෙරේ. | චක්‍රලේඛය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළයුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අලුත්වැව ගොවිජන සේවා කාරක සභාවේ අතැතිව කිසිදු මුදලක් නොතිබියදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ ගොවිජන සේවා කාරක සභාවේ විධායක ලේකම්ගේ අත්සනින් යුතුව ඉදිරිපත් කර ඇති, අත ඉතිරි මුදල් සහතිකයේ රු.530,074ක් පවතින බව දැක්වීම හේතුවෙන් එදිනට කාරක සභාවේ ජංගම වත්කම් එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි. | අත ඉතිරි මුදල සම්බන්ධ පරීක්ෂණ කමිටුවක් පත්කර ඇත. එහි නිර්දේශ මත ඉදිරියේදී කටයුතු කරමි. | මුදල් හිඟය සම්බන්ධයෙන් නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය විනය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හා සත්‍ය ජංගම වත්කම් හෙළිදරව් කිරීමට කටයුතු කලයුතුය. |
| (ආ) හිඟුරුකඩුව ගොවි බැංකුව සඳහා මුද්‍රණ යන්ත්‍ර 02 ක් සහ ස්කැනර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ගෙවන ලද රු.194,205 ක මුදල ඉදිරියට කල ගෙවීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වාර්තාවේදී නිවැරදි කිරීමට උපදෙස් දී ඇත. | ඉදිරියට කල ගෙවීම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකෙන් අඩු වටිනාකම මත තොගයේ අගය දැක්විය යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 15කට අදාලව කිසිදු විකුණුම් වටිනාකමක් නොමැති කල්ඉකුත්වූ එකතුව රු.4,636,342ක් වූ තොග වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉතිරි තොග ලෙස ඇතුලත්ව තිබීමෙන් එම වටිනාකමින් ජංගම වත්කම් හා අතිරික්තය වැඩියෙන් දක්වා තිබුණි. | 2024 ගිණුම් වාර්තාවේදී නිවැරදි තොරතුරු ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | යල්පැන ගිය තොග විධිමත් පරිදි අපහරණය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කලයුතුය. |
| (ඈ) 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය හා වෙනත් ආයතන විසින් මිලදීගෙන ගොවිජන සේවා කාරක සභා 14ක් වෙත ලබාදුන් කාර්යාල උපකරණ ඒකක 333ක්ද, ගොවි සංවිධාන පරිත්‍යාග වශයෙන් ගොවිජන සේවා කාරක සභා 03කට ලබාදී තිබූ කාර්යාල උපකරණ 55ක්ද, වටිනාකම් හඳුනාගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | සියලු කාර්යාල උපකරණ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | කාරක සභාවට ලැබුණු සියලුම වත්කම් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කලයුතුය. |
| (ඉ) ගොවිජන සේවා කාරක සභා 15 ක ගොවිජන සේවා මධ්‍යස්ථානය පිහිටි ඉඩම් පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් පවරාගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර, පවරාගත් වහාම වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | කාරක සභාව සතු ඉඩම්වල අයිතිය තහවුරු කරගෙන වටිනාකම ගිණුම්ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂයේ පරිගණක හා උපාංග මිලදීගැනීම සඳහා ගොවිජන කාරක සභා 13 ක් විසින් ගොවිජන සේවා සහකාර කොමසාරිස් කාර්යාලය වෙත රු.5,991,960 ක් ගෙවා තිබූ අතර, අදාල උපකරණ කාරක සභා වෙත ලැබී නොතිබියදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමෙන් ජංගම නොවන වත්කම් රු.5,991,960 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පරිගණක උපාංග මධ්‍යස්ථානයට ලැබුණු පසු වත්කම් ගිණුම්ගත කිරීමට උපදෙස් දී ඇත. ඉදිරියේදී නිවැරදි කෙරේ. | වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) මැදගම ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු ගොවි බැංකු ලාභාංශ රු.408,949 ක් ගිණුම්වල ගලපා නොතිබීමෙන් ජංගම වත්කම් හා වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වාර්තාවේදී නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඇත. | ලැබිය යුතු ලාභාංශ නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඌ) ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් විවිධ ආයතන වෙත භාර දී වෙන්දේසි කර භාවිතයෙන් ඉවත් කර ඇති හා අක්‍රියව පැවති රු.3,296,984 ක් වූ වත්කම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාරක සභාවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | කොමසාරිස් ජනරාල්වරයාගේ උපදෙස් හා අනුමැතිය අනුව ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත්කර නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමි. | අපහරණ තත්වයේ පැවති ස්ථාවර වත්කම් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2020 හා මුදල් රෙගුලාසි 770(4) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කලයුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී ගොවිජන සේවා මධ්‍යස්ථාන 09 ක් සතුව තිබූ රු.14,494,265 ක් වටිනා ජංගම නොවන වත්කම් ගිණුම්ගත නොකිරීමෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේ ගිණුම් වාර්තාවේ නිවැරදිව ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදී ඇත. | ජංගම නොවන වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඒ) ගොවිජන සේවා කාරක සභා 6ක් විසින් පවත්වාගෙන ගිය ස්ථාවර තැන්පත් වලට අදාලව ලැබිය යුතු පොලිය රු.500,074ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ලැබිය යුතු පොලී නිවැරදිව ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී ඇත. | ලැබිය යුතු පොලිය හඳුනාගෙන ගිණුම්ගත කලයුතුය. |
| (ඔ) ගොවිජන සේවා කාරක සභා 3ක් විසින් ක්ෂය කර පොත් වලින් ඉවත් කර තිබුණු භාවිතා කල හැකි තත්ත්වයේ පවතින රු.2,889,290ක යන්ත්‍රෝපකරණ හා වාහන ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණන වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | යන්ත්‍ර හා උපකරණ නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | අදාල වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල නිරූපණය කළ යුතුය. |
| (ඕ) ගොවිජන සේවා කාරක සභා 2 ක් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති පොහොර තොගයේ වටිනාකම වූ රු.12,722,644 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී ඇත. | ජංගම වත්කම් සංරචක නිවැරදිව වර්ගීකරණය කල යුතුය. |

| | | |
|---|---|---|
| (ක) සමාලෝචිත වර්ෂයේදී ගොවිජන සේවා කාරක සභා 07 ක් විසින් දිස්ත්‍රික් කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු රු.553,236 ක් ලැබිය යුතු ශේෂය වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලැබිය යුතු ගිණුම් හා අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | ලැබිය යුතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කලයුතුය. |
| (ග) ගොවිජන සේවා කාරක සභා 03 ක සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදම් රු.183,789 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | ගෙවිය යුතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කලයුතුය. |
| (ජ) මැදගම ගොවිජන සේවා කාරක සභා ගොඩනැගිල්ල 2014 වර්ෂයේදී රු.4,085,250 ක වටිනාකමකට තක්සේරු කර වසර 09 ක් ගතවී තිබුණද, නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සියලුම මධ්‍යස්ථාන තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තා ලබා ගෙන ඇත. නිවැරදිව ගිණුම්ගත කිරීමට උපදෙස් ලබාදී ඇත. | වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |
| (ට) ගොවිජන සේවා කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොහොර තොගයේ වටිනාකම රු.486,713 ක් වැඩියෙන් දක්වා තිබීමෙන් අතිරික්තය හා ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට උපදෙස් දී ඇත. | තොග වටිනාකම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කලයුතුය. |
| (ඩ) ගොවිජන සේවා කාරක සභා 02 ක කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් වෙත 2013 සිට 2015 වර්ෂවලදී ලබාදී තිබුණු කාර්යාල උපකරණ 96 ක් ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු අතර, ඒවායේ වටිනාකම ලබාගෙන ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි. | ලබාදී ඇති කාර්යාල උපකරණ වටිනාකම ලබාගෙන ගිණුම්ගත කිරීමට උපදෙස් දී ඇත. | කාරක සභාව වෙත අයිතිය පවතින සියලු වත්කම් ඉන්වෙන්ට්‍රිගත කර ගිණුම්ගත කලයුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බඩල්කුඹුර, බිබිල හා මොණරාගල යන කාරක සභා 03හි සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයන් 09 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව පැවති ශේෂයන්, උපලේඛන අනුව පැවති ශේෂයන් සමඟ සැසඳීමේ දී රු. 200,754 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | ගිණුම් ශේෂයන් උපලේඛණ සමඟ සසඳා නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

### 1.3.4 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 7 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු එකතු වටිනාකම රු.31,260,294 ක් වූ ගිණුම් ශේෂ 74 කට අදාලව ඒවා සනාථ කර ගැනීම සඳහා ශේෂ සනාථන ලිපි, අරමුදල් පිහිටුවීමේ අරමුණු විස්තරාත්මක උපලේඛණ, කාලවිශ්ලේෂණ යනාදි ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය / සත්‍යාපනය කිරීමට නොහැකි විය. | නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඇත. | ගිණුම් ශේෂ සනාථ කර ගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි සනාථ කර ගත යුතුය. |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) 51(1) උප වගන්තියට | පනත සම්මත කර වසර 23 කට වැඩි කාලයක් ගතවී තිබුණද, ගොවිජන සේවා බල ප්‍රදේශ 18ක් සඳහා පනතේ විධිවිධාන පරිදි ගොවිජන සංවර්ධන සභා සංස්ථාපනය කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා ගේ උපදෙස් අනුව ක්‍රියාකරනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතුය. |
| (ii) 51(7) උප වගන්තිය | ගොවිජන කාරක සභාවේ සභාපති පත් කිරීම, සභාපතිගේ කාර්යභාරය , ස්ථාවර කාරක සභා පත් කිරීම සහ ලේකම් හා භාණ්ඩාගාරික තෝරාපත් කර ගැනීම පිළිබඳ නියෝග සකස් කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව ගොවිජන සංවර්ධන සභාවක් සංස්ථාපනය කල යුතුය. |
| (iii) 52(1) උප වගන්තිය | සෑම ගොවිජන කාරක සභාවක් විසින්ම, සෑම වගා කන්නයකට පෙරාතුවම, ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයක් සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් සහ අවශ්‍ය සංවර්ධන සැලැසුම් පිළියෙල කර නොතිබුණි. | කෘෂිකාර්මික වැඩසටහන් හා සැලසුම් පිළියෙල කරවීමට අවශ්‍ය පියවර ගනිමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කෘෂිකාර්මික වැඩසටහන් හා අවශ්‍ය සංවර්ධන සැලසුම් පිළියෙල කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) 53(1) උප වගන්තිය | සෑම ගොවිජන කාරක සභාවක් විසින්ම ස්වකීය බල ප්‍රදේශය ඇතුලත කෘෂිකාර්මික ඉඩම් පිළිබඳව ලේඛණයක් පිළියෙල කිරීම, සංශෝධන සහ ප්‍රතිශෝධන සහිතව පවත්වාගෙන යාම සහ එම සභාවේ බල ප්‍රදේශය ඇතුලත කෘෂිකාර්මික ඉඩම්වලට අදාල පළමු ලේඛණය කොමසාරිස් ජනරාල් විසින් පිළියෙල කර, සහතික කිරීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි. | කෘෂිකාර්මික ඉඩම් ලේඛණ පිළියෙල කර සංශෝධනය කරමින් පවත්වා ගනී. එහි පළමු ලේඛණය ගොවිජන සංවර්ධන කොමසාරිස් වෙනුවෙන් සහකාර කොමසාරිස් විසින් සහතික කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (v) 54(1) උප වගන්තිය | සෑම කෘෂිකාර්මික ඉඩමකම ඉඩම්හිමි ගොවියා හෝ භුක්තිකරු විසින්, ඒ ඉඩම පිහිටි බල ප්‍රදේශය ඇතුලත වූ ගොවිජන කාරක සභාව වෙත, එම කෘෂිකාර්මික ඉඩම පිළිබඳව නියමිත විස්තර, එහි අයිතිය, තත් කාලයේ පදිංචිය සහ එම සභාව විසින් සඳහන් කරනු ලැබිය හැකි යම් කාලපරිච්ඡේදයක් ඇතුලත කරගෙන ගිය සියලු කෘෂිකාර්මික කටයුතු පිළිබඳව තොරතුරු ලියවිල්ලකින් දැනුම්දී නොතිබුණි. | මෙම විස්තර අවශ්‍යතාවය අනුව ලබාගැනීමට කටයුතු කර ඇත. | - එම - |
| (vi) 56(1) උප වගන්තිය | සෑම කෘෂිකාර්මික ඉඩමක් සඳහාම නියම කරනු ලබන අක්කර බදු මුදල්, කෘෂිකාර්මික ඉඩමක සෑම අයිතිකරුවෙකු හෝ භුක්තිකරුවෙකු විසින්ම, එක් එක් වර්ෂයේ මාර්තු 31 වන දින හෝ ඊට පෙර ගොවිජන කාරක සභාවට ගෙවීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු අයවෙමින් පවතී. | - එම - |
| (vii) 75(1) උප වගන්තිය | සෑම ගොවිජන කාරක සභාවක් විසින්ම ස්වකීය බල ප්‍රදේශය ඇතුලත ඉඩම්හිමි ගොවියන්ට හෝ කෘෂිකාර්මික ඉඩම්වල භුක්තිකරුවන්ට හැඳුනුම්පත් නියමිත ආකාරයට නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවි හැඳුනුම්පත් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගනිමි. | - එම - |

(ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) මු.රෙ 206 | තැන්පත් වලින් මුදල් ආපසු ගෙවීමේදී ගෙවීම් ලැබීමට හිමිකමක් ඇති තැනැත්තාට නිවැරදි වටිනාකම ආපසු ගෙවන බව තහවුරු කර ගැනීමට මුදල් තැන්පත් කිරීමට අදාල රිසිට්පත්‍රය මුල් පිටපත වවුචරයට ඇමිණිය යුතු වුවත්, ඔක්කම්පිටිය ගොවිජන සේවා කාරක සභාව විසින් එසේ රිසිට්පත්‍රය ලබාගෙන අවලංගු කිරීමකින් තොරව බාහිර පුද්ගලයෙකුට 2023 පෙබරවාරි 07 දිනැති අංක 2023/07 දරණ වවුචරය මඟින් රු.250,000ක් ගෙවීම් කර තිබුණි. | පරීක්ෂා කොට ඉදිරි පියවර ගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) මු.රෙ 316 | මූල්‍ය වටිනාකමක් ඇති මුදල් හා ලේඛණ තබා ගැනීම සඳහා ආරක්ෂිත සේප්පුවක් භාවිතා කලයුතු වුවද, කාරක සභා 02 ක් විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ආරක්ෂිත සේප්පු භාවිතා කරන ලෙස උපදෙස් ලබාදී ඇත. | - එම - |
| (iii) මු.රෙ 396 | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් 2017 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුල නිකුත් කරන ලද මාස 06 ඉක්මවූ රු.211,783 ක් වටිනා චෙක්පත් 10ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව සිදුකල යුතු බවට උපදෙස් ලබාදී ඇත. ඉදිරියේදී නිවැරදි කරමි. | - එම - |

(ඇ) **ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ**

| | | | |
|---|---|---|---|
| 2014 අගෝස්තු 22 දිනැති අංක 07/2014 (107 සංශෝධන iii) දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභාවක දෛනිකව උපරිම අත රඳවාගත හැකි මුදල රු.10,000 ක් වුවද, කාරක සභා 16 ක් විසින් 2023 ජූලි සිට සැප්තැම්බර් දක්වා අතැති මුදල් රු.11,658 සිට රු.29,283 ක් දක්වා පරාසයක අත රඳවාගෙන තිබුණු අවස්ථා 149ක් නිරීක්ෂණය විය. | මධ්‍යස්ථාන ආසන්නයේ බැංකු නොපවතින බැවින් පසුදින බැංකු ගත කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් නිකුත් කරන ලද 2023 සැප්තැම්බර් 13 දිනැති හා අංක 7/5/9-05 (මෙ.හෙ.පො) II වෙළුම දරණ ලිපිය | ගොවිජන සේවා කාරක සභාවල මුදල් පරිහරණයේදී රු. 20,000 ක සුළු මුදල් අග්‍රිමයක් පවත්වාගෙන යාම හැර වෙනත් මුදල් ලැබීම් සියල්ල දෛනිකව බැංකුගත කලයුතුය. එසේ වුවද, ගොවිජන සේවා කාරක සභා 03 ක දෛනික මුදල් පොත පරීක්ෂාවේදී, මුදල් දෛනික ගිණුම්ගත කිරීමෙන් තොරව අවස්ථා 21 කදී රු.85,353 සිට රු.475,090 දක්වා පරාසයක මුදල් අතරදවාගෙන තිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇති අතර,මධ්‍යස්ථාන පරීක්ෂණ වලදී අවශ්‍ය පියවර ගනිමි. | චක්‍රලේඛය ප්‍රකාරව සුළු මුදල් අග්‍රිමය හැර ඉතිරි මුදල් ගිණුම්ගත කර බැංකුගත කිරීම කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 13හි එකතුව රු.18,227,169 ක අතිරික්තයක් හා කාරක සභා 05 ක එකතුව රු.961,367 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ඌනතාවය පිළිවෙලින් රු.10,344,600 ක් හා රු.490,880ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 18හි එකතුව රු.7,347,870ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.8,106,054 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 ජනවාරි සිට ජූලි දක්වා කාලයට අදාලව එක් එක් මාසය අවසානයට බැංකු ගිණුම්වල පැවති ශේෂය අනුව කාරක සභා 09ක් සතු කම්වු බැංකු ජංගම ගිණුම්වල රු.32,916,845ක සිට රු. 114,252,060ක් දක්වා වූ පරාසයක් තුල මුදල් ශේෂ පැවති අතර, එම මුදල් වැඩි පොලී ආදායමක් ලැබෙන අයුරින් ඵලදායී ලෙස කෙටිකාලීනව ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දීර්ඝ කාලයක් ගිණුමේ රඳවා ගන්නා මුදල්, ස්ථිර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමට උපදෙස් දී ඇත. ඒ අනුව කටයුතු කරමි. | කාරක සභාව සතු අරමුදල් සඳහා උපරිම ප්‍රතිලාභය ලැබෙන පරිදි විධිමත් අනුමැතිය මත ආයෝජනය කිරීමට කටයුතු කළයුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාරක සභා 18 කගොවිජන සේවා බල ප්‍රදේශ තුල කුඹුරු ඉඩම් අක්කර 90426 ක් පවතින බව හඳුනාගෙන තිබුණද, කුඹුරු ඉඩම් නාමලේඛණයේ කුඹුරු ඉඩම් අක්කර 29677.5ක් පමණක් ඇතුලත් කර තිබුණි. අයිතිය තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් කුඹුරු ඉඩම් අක්කර 60748.5 ක් ලේඛණගත කර නොතිබුණි. | අයිතිය තහවුරු කරගත හැකි සියලුම ඉඩම් ලේඛණයට ඇතුලත් කර ඇති අතර, අයිතිය තහවුරු කරගත නොහැකි ඉඩම් විස්තර සියල්ල ඒ සඳහා වන දත්ත පද්ධතියට අදාල | බල ප්‍රදේශය සතු සියලු කුඹුරු ඉඩම් ලේඛණ ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| | කෙටුම්පතට ඇතුලත් කර ඇත. | |
| (ආ) ගොවිජන සේවා කාරක සභා 05ක් සතුව පවතින කුඹුරු අක්කර 49,737ක් "Geo Goviya'' වැඩසටහන යටතේ මැණුම් කිරීමට අයදුම්පත්‍ර 35,248ක් ලැබී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට මැණුම් අවසන් කර තිබුණේ ඉඩම් කට්ටි 21,829ක් පමණක් බව නිරීක්ෂණය විය. | කුඹුරු ඉඩම් මැනීමේ කටයුතු තවදුරටත් සිදුකරමින් පවතින අතර, කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | සියලු කුඹුරු ඉඩම් කඩිනමින් මැනුම් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) ගොවිජන සේවා බල ප්‍රදේශය තුල කෘෂිකාර්මික ඉඩම් ලේඛනය සංශෝධනය කරමින් පවත්වාගත යුතු වුවත්, කාරක සභා 04 ක 2018 වර්ෂයෙන් පසු සංශෝධනය කර නොතිබුණි. 2019 වර්ෂයේ සිට 2023 සැප්තැම්බර් දක්වා කුඹුරු ඉඩම් නාමලේඛණය සඳහා සංශෝධිත අයදුම් පත්‍ර 514 ක් ලැබී තිබුණද, ඒවා සම්බන්ධ කටයුතු අවසන් කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ඉඩම් හිමියන්ගේ සංශෝධන සඳහා වන ඉල්ලීම කඩිනමින් ඉටුකරදීමට කටයුතු කල යුතුය. |
| (ඈ) 2023 වර්ෂයේ දී කතරගම ගොවිජන සේවා කාරක සභාව හා ගොවිජන බැංකුව සඳහා මිලදීගත් රු. 639,450 ක් වටිනා මුද්‍රණ යන්ත්‍රය හා පරිගණක යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුලත් කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | සියලුම ඉන්වෙන්ට්‍රිගත කලයුතු වත්කම් ඉන්වෙන්ට්‍රි ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 30 දින ගිණුම්කරණ මෘදුකාංගයක් මිලදීගැනීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන 18 විසින් රු.17,131 ක් බැගින් එකතුව රු.308,358 ක් වැයකර තිබුණද, 2024 මාර්තු 31 දින වන විටත් පරිගණක ගත ගිණුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි. | මෘදුකාංගය ප්‍රධාන කාර්යාලයෙන් ලද පසු පරිගණක ගත ගිණුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමට කටයුතු කරමි. | පරිගණකගත ගිණුම්කරණ ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කල යුතුය. |
| (ඊ) ගොවිජන සේවා බල ප්‍රදේශ 05 ක් තුල කුඹුරු අක්කර 4,714 ක් සඳහා අයවිය යුතු අක්කර බදු රු.193,280 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු අයකරමින් පවතී. | සියලු කුඹුරු ඉඩම් සඳහා අක්කර බදු අයකලයුතුය. |
| (උ) සමාලෝචිත වර්ෂයේ බඩඉරිඟු බීජ මිලදීගැනීම සඳහා රු.950,000 ක් වැයකිරීමටත්, ඒවා අලෙවි කිරීමෙන් රු.1,000,000 ක් ඉපයීමටත් සැලසුම් කර තිබුණද, ඇතිමලේ ගොවිජන සේවා කාරක සභාව විසින් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රායෝගික ගැටළු හේතුවෙන් අදාල කාර්යය කිරීමට නොහැකි වී ඇති අතර, ඉදිරියේදී නිවැරදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | තාත්විකව සැලසුම් සකස් කල යුතුය. |
| (ඌ) සමාලෝචිත වර්ෂයේ කෘෂි උපකරණ, බිත්තර වී, කෘෂි රසායන ද්‍රව්‍ය හා එළවළු බීජ මිලදී ගෙන අලෙවි කර | මේ සම්බන්ධයෙන් ඉදිරි කන්නයේදී කටයුතු | තාත්විකව සැලසුම් සකස් |

| | | |
|---|---|---|
| රු.610,000 ක් විකුණුම් ආදායමක් ලබාගැනීමට අපේක්ෂා කර තිබුණද, ඔක්කම්පිටිය ගොවිජන සේවා කාරක සභාව විසින් එම ද්‍රව්‍ය මිලදී ගැනීමට හෝ අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි. | කිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදී ඇත. | කල යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022/23 මහ කන්නයේ හා 2023 යල කන්නයේ වී වගාව සඳහා පොහොර මිලදී ගැනීමේදී අවශ්‍යතාවයන් ඉක්මවා පොහොර මිලදී ගැනීම නිසා ගොවිජන සේවා කාරක සභා 08 ක විගණන කාලපරිච්ඡේදය වන 2024 ජුනි මාසය අවසානය වන විට රු.21,928,895 ක් වූ යූරියා කිලෝග්‍රෑම් 120,846 ක් සහ රු.21,925,623 ක් වූ MOP පොහොර කිලෝග්‍රෑම් 121,399 ක්ද වශයෙන් එකතුව රු.42,783,878 ක් වූ පොහොර කිලෝග්‍රෑම් 242,245 ක් වර්ෂයක පමණ කාලයක් ගබඩාවල තැන්පත් කර තිබූ අතර, වෙළඳපොලේ පොහොර මිල පහත වැටීම හා ඒවායේ ගුණාත්මකභාවය අඩුවීම නිසා ගොවීන් විසින් එම පොහොර මිලදීගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. | පොහොර මිලදී ගනු ලබන්නේ වගා ඉලක්කයට වන අතර, ඉතිරි පොහොර ඉදිරි කන්නවල ගොවීන් වෙත ලබාදීමට උපදෙස් ලබා දී ඇත. | කන්නයට අදාලව නිර්දේශිත පොහොර මිලදීගෙන නියමිත පරිදි බෙදාහැරිය යුතුය. |
| (ආ) කාරක සභා 16 ක 1991 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුල විවිධ පාර්ශවයන් ගෙන් අයවිය යුතු රු.34,858,926 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | නිවැරදිව හඳුනාගෙන අයකිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) කාරක සභා 03 ක රු.3,187,139 ක්වූ ගෙවිය යුතු ශේෂ, හිමිකම් නොපෑම සහ ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දිගින් දිගටම පැවත එන අතර එම ශේෂ විධිමත් අනුමැතියක් මත සමුච්චිත අරමුදලට බැර කර නොතිබුණි. | ඉතිරි ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කලයුතුය. |
| (ඈ) කාරක සභා 09 ක 1984 වර්ෂයේ සිට පැවත එන 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.12,951,406 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | ශේෂ සනාථ කර නිරවුල් කිරීමට කටයුතු කලයුතුය. |
| (ඉ) ගොවිජන සේවා කාරක සභා 5ක 2007 සිට 2015 වර්ෂය දක්වා නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,167,273 ක් අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | සක්‍රීය සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ වැටුපෙන් හා සේවයේ නොමැති නිලධාරීන්ගෙන් නීතිමය වශයෙන්ද අයකර ගැනීමට කටයුතු කරමි. | අයවියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කලයුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) ගොවිජන සේවා කාරක සභා 3ක 2010 සිට 2015 දක්වා නිලධාරීගේ අක්‍රමිකතා හේතුවෙන් සිදු වී තිබූ රු.3,013,366 ක අලාභ අයකරගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | අදාල නිලධාරීන්ගෙන් සිදු වී ඇති අලාභ අයකරගත යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2016 ජුනි 11 දිනැති අංක 10/2015 දරණ චක්‍රලේඛය අනුව ගොවිජන සේවා කාරක සභාව සතු කෘෂි යන්ත්‍ර උපකරණ නිශ්කාර්යව නොතිබිය යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 12කට අදාලව වටිනාකම රු.15,618,283ක් වූ උපකරණ 30 ක්ද, වටිනාකම දක්වා නොතිබුණු උපකරණ 29 ක්ද, නිශ්කාර්යව පැවතුණි. | නිෂ්කාර්යව පවතින උපකරණ අවශ්‍ය මධ්‍යස්ථානයකට ලබාගත හැකි බවට දැනුවත් කර ඇති අතර, අවශ්‍යතාවයක් නොවේ නම් වෙනත් දිස්ත්‍රික්කයක් වෙත ලබාදීමට ඇති හැකියාව සොයා බලා කටයුතු කරමි. | නිශ්කාර්යය වත්කම් කාර්යක්ෂමව භාවිතා කල හැකි කාරක සභා වෙත ලබාදිය යුතුය. |
| (ආ) ගොවිජන සේවා කාරක සභා 12 කට අදාලව නිල නිවාස 12 ක් අලෙවිසැල් 02 ක් හා කඩ කාමර 05 ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | නිල නිවාස 12 අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරමි. අලෙවි සැල් 02 හා කඩකාමර ඵලදායී ලෙස භාවිතයට ගැනීම පිළිබඳ උපදෙස් දෙන ලදී. | නිශ්කාර්යය ගොඩනැගිලි කාර්යක්ෂමව භාවිතා කල යුතුය. |
| (ඇ) සියඹලාන්ඩුව ගොවිජන සේවා කාරක සභාව විසින් 2019 වර්ෂයේදී ගොවිජන අභිමන් තරගාවලියට සමගාමීව කමිටු අරමුදලින් රු.791,957 ක් යොදවා හෙළ බොජුන්හලක් ආරම්භ කිරීමේ අරමුණින් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි පවතින අඩුපාඩු සකස්කර අරමුණුගත කාර්යට යොදාගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | මෙ සම්බන්ධයෙන් පවතින ගැටළු අධ්‍යනය කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | හෙළ බොජුන්හල ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. |

**3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන සේවා කාරක සභා 10 ක 2020 වර්ෂයෙන් පසු වාරි ව්‍යාපෘති සිදුකර නොතිබුණි. 2022 වර්ෂයේදී අලුත්වැඩියා, නඩත්තු කිරීම් හා සංවර්ධනය කලයුතු වාරි ව්‍යාපෘති 140ක් හඳුනාගෙන තිබුණ ද ඒවා විගණන දිනය වූ 2024 මාර්තු 04 වන දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රතිපාදන ලද පසු අවශ්‍ය කටයුතු කරමි. | අවශ්‍යතා හඳුනාගනිමින් ප්‍රමුඛතාව පරිදි ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) බිබිල ගොවිජන සේවා කාරක සභාවට අයත් හාවාපොළ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වසමේ උයන්කුඹුරු වැවේ ගිනිපෙට්ටි පාලම ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් 2021, 2022 හා 2023 වර්ෂවල ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලීම් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් 2023/2024 මහ කන්නයේ වී වගා කරන කුඹුරු අක්කර 56ක ප්‍රමාණයකට වගා කටයුතු වෙනුවෙන් ජලය ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රමුඛතාවය අනුව අවශ්‍යතාවය මත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා රජයෙන් ලැබෙන ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට සිදුවේ. | අවශ්‍යතා හඳුනාගනිමින් ප්‍රමුඛතාව පරිදි ව්‍යාපෘති ඉටුකිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) නෙල්ලියද්ද ගොවිජන සේවා කාරක සභාවට අයත් ගල්ගමුව කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වසමේ පයිලේකන්ද වැව ප්‍රතිසංස්කරණය ආරම්භකර තිබුණද, එම ව්‍යාපෘතිය අතරමැද නවතාදැමීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට වැවෙහි ජලය භාවිතාකර කුඹුරු අස්වද්දනු ලබන ගොවීන් 56 දෙනෙකුට අයත් කුඹුරු අක්කර 170ක් වර්ෂ 03ක කාලයක සිට වගාකල නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. | ලැබෙන ප්‍රතිපාදන මත කටයුතු කිරීමට සිදුවේ. | අදාල ව්‍යාපෘති නිසි වේලාවට අවසන් කල යුතුය. |
| (ඈ) අලුත්වැව ගොවිජන සේවා කාරක සභා බල ප්‍රදේශයට අයත් ගොවීන් 34 දෙනෙකුට අයත් කුඹුරු ඉඩම් අක්කර 35 ක් වගා කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලෝක ආහාර වැඩසටහන යටතේ 2022 වර්ෂයේදී රු. 1,187,200 ක් වැයකර කරකොටේ වැව් කණ්ඩිය හා සොරොව්ව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය නිමකර තිබුණි. එහෙත් කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් එම ගොවීන්ට නීත්‍යානුකූල හිමිකමක් නොමැති වීමෙන් වන සංරක්ෂන දෙපාර්තමේන්තුව විසින් ගොවීන් වගාබිම්වලට ඇතුළුවීම වලක්වාලීම හේතුවෙන් වගාකිරීමට අපේක්ෂා කල කුඹුරු ඉඩම් වගාකර නොතිබුණි. ඒ අනුව වැව ප්‍රතිසංස්කරණය කිරීමෙන් අපේක්ෂා කල අරමුණ ඉටුවී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | කළමනාකාරිත්වයේ අදහස් දක්වා නොමැත. | කිසියම් ඉදිකිරීමක් සිදු කිරීමට පෙර අදාල භූමිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කලයුතුය. |

## 3.6 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2022 අප්‍රේල් 20 දිනැති අංක 7/3/11/CSIAP.Mac/COM/2022 දරණ මාර්ගෝපදේශයේ 02 (ii) පරිච්ඡේදය ප්‍රකාරව ගොවිපල යන්ත්‍රෝපකරණ හා උපාංග ඒකකය පවත්වාගෙනයාම සඳහා වැල්ලවාය ගොවිජන සේවා කාරක සභාව විසින් අනුකම්ටුවක් පත්කර නොතිබුණු අතර, වැල්ලවාය හා බුත්තල ගොවිජන සේවා කාරක සභා විසින් ඒකකයේ අධීක්ෂණ කටයුතු සඳහා සංවර්ධන නිලධාරියකු පත්කර නොතිබුණි. සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ කාරක සභා වෙත ලබා දී තිබුණු වත්කම්වල වටිනාකම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර, 2021 වර්ෂයේදී ලද වී වගාවට යොදාගනු ලබන පැල/බීජ ඉසින යන්ත්‍ර 02 ක් 2022 වර්ෂයේ ලැබුණු පැල සිටුවන යන්ත්‍ර 08 ක් හා තවාන් තැටි 10,415 ක් 2023 වර්ෂයේදී ලද වල්නෙලීමේ යන්ත්‍ර 06 ක් 2023 වර්ෂයේ ලැබුණු ජංගම අලිවැට උපකරණ කට්ටල 07 ක් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්කාර්යව තබාගෙන තිබුණි. | බුත්තල මධ්‍යස්ථානයේ ඒකක අධික්ෂණය සඳහා සංවර්ධන නිලධාරියකු පත් කර ඇත. අනෙකුත් යන්ත්‍ර උපකරණ කන්නයේ වගාව ආරම්භයේදී ගොවීන්ගේ අවශ්‍යතාවය හා ඉල්ලීම මත කෘෂිකර්ම උපදේශකවරුන්ගේ අධික්ෂණය සහ මඟ පෙන්වීම යටතේ ලබාදීමට කටයුතු කර ඇත. ජංගම අලි වැට ඒ ඒ කන්නවලදී භාවිතා කර නැවත ගබඩාවේ ගබඩා කරනු ලබයි. කන්න තුල අවශ්‍යතාවය පරිදි භාවිතා කිරීමට නිකුත් කරනු ලබයි. | මාර්ගෝපදේශ හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ තෙළුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලැබුණු පැල සිටුවන යන්ත්‍රයක් කෘෂිකර්ම උපදේශක විසින් 2022 වර්ෂයේදී අවිධිමත්ව ගොවිමහතෙකු වෙත ලබාදී තිබුණි. විගණන දිනය වූ 2024 පෙබරවාරි 29 දින වන විටත් එම යන්ත්‍රය අදාල ගොවි මහතා විසින් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත සුරක්ෂිතව භාර දී නොතිබුණි. | මධ්‍යස්ථානය මගින් ගොවීන් වෙත ලබාදෙන උපකරණ විධිමත්ව නැවත ලබාගැනීමට උපදෙස් දී ඇත. | කාරක සභාව සතු යන්ත්‍ර අදාල කාර්යය අවසන් වූ පසු, නැවත කාරක සභාවට ලබාගැනීමට කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2022 ජනවාරි 11 දිනැති හා අංක 7/5/12/ගි.වා. පොදු දරණ ලිපිය අනුව ගොවිජන සේවා කාරක සභා විසින් මූල්‍ය ප්‍රකාශන නිවරදිව සකස්කර සෑම වර්ෂයකම මාර්තු 31 දින වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද, ගොවිජන සේවා මධ්‍යස්ථාන 03ක් විසින් 2024 අප්‍රේල් 01 සිට 2024 මැයි 27 දක්වා දින 57ක් ප්‍රමාද වී අවසන් ගිණුම් ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී අවසන් ගිණුම් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කරමි. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |

**5. ගොවිජන බැංකු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවි බැංකු 18 ක් විසින් 1999/2000 මහ කන්නයේ සිට 2023 යල කන්නය දක්වා ලබාදී තිබුණු කෘෂි උපකරණ ණය, ව්‍යාපෘති ණය, වගා ණය, සාර ලංකා හා සෞභාග්‍යා සාර ලංකා යන ණය වර්ග වෙනුවෙන් අයවිය යුතු හිඟ ණය රු.106,559,775 ක් හා පොලී මුදල් රු.16,897,629 ක් වශයෙන් වූ එකතුව රු.123,457,404 ක් විගණන දිනය වූ 2023 දෙසැම්බර් 31 වන දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | කල්පසු වූ ණය අයකරගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2017 හා 2018 වර්ෂ තුලදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වැල්ලවාය ගොවි බැංකුව වෙත වසර 03ක කාලයක් සඳහා ලබාදී තිබුණු ප්‍රාග්ධන මුදල් රු.2,000,000ක් අතරින් 1,500,000 ක මුදලක් විගණන දිනය වන 2024 මාර්තු 25 දින වන විටත් නැවත දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි. | මෙයට අදාල පොලීය ගෙවා ඇති අතර, හිඟ ප්‍රාග්ධන මුදල කඩිනමින් ගෙවීමට උපදෙස්දී ඇත. | අදාල මුදල් කඩිනමින් පියවීමට කටයුතු කල යුතුය. |